Accept no one's definition of your life; define yourself.

Harvey Fierstein

මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ.. හිතට වැදෙන දේ..

ජගත් පේ එදිරිසිංහ

දඟයා සහ මුත්තගෙ විත්ති

"දඟයා සහ මුත්තගෙ විත්ති" ළමා නාට්‍යය නරඹන්නට එන්නැයි කුසුම්සිරි හා යසෝදරා සොයුරු සොයුරියන් දෙවතාවක්ම ආරාධනා කළත් ඒ දෙවතාවේම යන්නට නොහැකි විය. පළමු වතාවේ කළින් යොදාගත් වෙනත් වැඩක් නිසාත් දෙවන වතාවේ සිසිර දිසානායක සොහොයුරාගේ සංගත තැටිය එළිදැක්වීම නිසාත් ය. මා මුහුණ පෑ තත්වය තේරුම් ගෙන දෝ තුන්වන වතාවටත් ආරාධනා පතක් එවීම ගැන කුසුම්සිරි යසෝදරා යුවළට පින් දෙමි. පින් දෙන්නේ "දඟයා සහ මුත්තගෙ විත්ති" නරඹා මා අසීමිත වින්දනයක් ලද බැවිනි.

මේ වන විට මේ නාට්‍යය සම්බන්ධයෙන් බොහෝ සටහන් ලියැවී ඇත. එසේ ලියැවුණ සියළුම සාධනීය කාරණා සමග මම එකඟ වෙමි. කුඩා දරුවන් ඊනෑක් එක් කර ගනිමින් කුසුම්සිරි " යසෝදරා පා ඇති පෙළහර විස්මිත ය. මේ දරු දැරියන් වේදිකාවේ රඟපානා බවක් අපට නොවැටහුණි. ඒ තරමට සැහැල්ලුවෙන් ඔවුහු තම තමන්ට පැවරුණ චරිත වේදිකාව මත පණ ගැන්වූ හ. නාට්‍යයට ඇවැසි සියලු කරුණු කාරණා කිසිදු අඩු පාඩුවක් නැතිවම ප්‍රතිනිර්මාණය කළ හ.

නාට්‍ය පිටපත ඇඳුම් හා පසුතල නිර්මාණය සංගීතය ආලෝකකරණය සහ දරු දැරියන් මෙහෙයවීම යන කිසිදු කාරණයක ඇදක් පලුද්දක් සොයාගන්නට නොහැකි තරම් ය. සංගීතය සඳහා ළමා වාද්‍ය වෘන්දයක සහය ලබා ගැනීමද පැසසිය යුතු ය.

කුඩා දරුවන් ලවා නාට්‍යයක් කිරීම නමැති මහගිරි දඹ කුසුම්සිරි " යසෝදරා යුවළ ඉතා පහසුවෙන් තරණය කර අතනි බව ලියා තබමි. කතාවට " පහසුවෙන්" කියා ලිව්ව ද ඒ වෙනුවෙන් ඔවුන් බොහෝ දුක් විඳින්නට ඇති බව නිසැක ය. අපූරු අත්දැකීමක් විඳගන්නට ඉඩ ලබා දී ඇසට සතුටු කඳුලක් නැංවීම වෙනුවෙන් ඔබට ස්තූතියි.

යෞවන රංගන

ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයන්ගේ දූ දරුවන් එක්වී යෞවන රංගන නමින් ප්‍රසංගයක් වේදිකා ගත කරන්නට යන බව මුලින්ම කීවේ සරත් වික්‍රමසිංහ සොයුරා ය. හංසිනී තෙබුවන හා අමිල ජයසේන සමගින් තවත් තරුණ තරුණියන් රැසකගේ සහභාගීත්වයෙන් එළි දැක්වුණ මේ ප්‍රසංගය නරඹන්න අවස්ථාවක් ලැබීම සතුටකි.

ප්‍රසංගයේ විශේෂත්වය වූයේ වේදිකා පරිපාලනය ආලෝකකරණය ආදී සියලුම තාක්ෂණික කටයුතු මේ තරුණ තරුණියන් අතින්ම සිදුවීමයි. එතිසාම ප්‍රසංගයේ සිදුවූ යම් යම් අතපසුවීම් වලට නියත සමාවක් ඔවුනට ලැබෙයි.

මෙය හොඳ ආරම්භයකි. වැඩිහිටියන් විසින් කරනු ලබන බොහෝ සංවිධාන කටයුතු පිළිබඳ යම් අද්දැකීමක් ලබා ගන්නට මෙයින් මේ දරු දැරියනට ඉඩ කඩ ලැබෙයි. වරද්දැ වරද්දා හෝ මේ අත්දැකීම ලබා ගත යුතු ය. ඔවුන් ගොඩ නැගෙන්නේ එවිට ය.

ප්‍රසංගයේ බොහෝ සාධනීය ලක්ෂණ අපි දුටුවෙමු. නිවේදන කටයුතු සඳහා විවිධ තරුණ තරුණියන් පැමිණීම අපූරුය. එකම නිවේදකයකු හෝ නිවේදිකාවක විසින් කරනු ලබන ඉදිරිපත් කිරීමකට වඩා විවිධත්වයක් මෙයින් ලැබෙනවා මතු නොව ඒ අලුත් නිවේදක නිවේදිකාවනට සිය හැකියාවන් උරගා බලන්නටද අවස්ථාවක් ලැබෙයි.

වේදිකාවේ පසුපස සුදු තිරය මත අවස්ථාවට ගැලපෙන දර්ශන ප්‍රක්ෂේපණය ද අපූරුය. (ඒ අපූරු දර්ශන මතට රතු හෝ වෙනත් තද පැහැ ආලෝක කදම්බයක් එල්ල කළ විට ඒ දර්ශනය නොපෙනී යන බව ආලෝකකරණය කළ අය තේරුම් නොගැනීම විශාල අඩුපාඩුවකි)

අති විශාල තරුණ තරුණියන් සංඛ්‍යාවක් මේ ප්‍රසංගයට දායක වීම පැසසුම් කටයුතු ය. ඔවුනගේ ඉදිරිපත්වීමේ ගුණය සුබ අනාගතයක් පිළිබඳ පැහැදිළි ඉඟියකි. ගායනයෙන් නර්තනයෙන් රඟපෑමෙන් ඔවුන් ප්‍රදර්ශනය කල දස්කම් අගය කළ යුතු ය.

මේ ගමනක ආරම්භයයි. අපූරුයි. නවත් ගව්ගණනක් දුර යන්නට අපෙන් සුබ පැතුම්.

අතීතයට

ප්‍රසංග දෙකක් පිළිබඳව මේ සටහන තබන මොහොතේ මගේ සිත එක්තරා දිනෙක එක්තරා ප්‍රසංගයක් වෙනුවෙන් මා ලියූ සටහන පිළිබඳ මතකය අවදි කරයි.

මේ ප්‍රසංගය වරුණ සාවින්ද ගේ "යසෝදරා වත" ප්‍රසංගයයි. දිනය 2001 ජූලි 1 දායි. ඒ මා ඔහු හඳුනාගත් අවධියයි. ඒ යුගයේ අප අතර සමීප ඇසුරක් නොවී ය.

රෝහණ කරුණාරත්න සෙවිවන්දිකා අබේරත්න දිනෙල්කා දර්ශණී සහ බන්දු තිළකරත්න මේ ප්‍රසංගයේ ගී ගායනා කළ බව මතක ය. යශෝදරා පුරාවෘත්තය වටා ගොනු කළ මේ ප්‍රසංගය මෙල්බන් වේදිකා ප්‍රසංග කලාවේ සන්ධිස්ථානයක් යයි මම අදත් අදහමි.

පළමු වතාවට මෙල්බන් ප්‍රසංගයක කලාත්මක ලෙස ආලෝකය යොදාගත් ආකාරය මා දුටුවේ "යසෝදරා වත" ප්‍රසංගයේ දී ය.

(එයින් පසු අද දක්වාම මෙල්බන් හි කිසිම ප්‍රසංගයක එවන් කලාත්මක ආලෝකරණයක් නොදැක්කෙමි. සැමතැනකම පාගේ සිදුවන්නේ එහෙන් මෙහෙන් වර්ණ ආලෝක එල්ල කරන අව්චාරුය අලෝකකරණයකි) මට මතක හැටියට "යසෝදරා වත" ප්‍රසංගයේ ආලෝකකරණය කළේ ජගත් කොතලාවල යි. ගාමිණී රණසිංහගේ පසුතල නිර්මාණ වල පවා නැවුම් බවක් විය.

ප්‍රසංගය අරඹමින් රෝහණ කරුණාරත්න ගැයූ "යසෝදරා" ගීතය එතෙක් මෙතෙක් මෙල්බන් වේදිකාවක් මත කෙරුණ හොඳම ගායනයයි. සෙවිවන්දිකා අබේරත්නත් දිනෙල්කා දර්ශණී.ත් මේ ප්‍රසංගයේදී පෙන්වූ දක්ෂතා කිසිදා අමතක නොවන තරම් ය.

"යසෝදරාවත" ප්‍රසංගය නැවත වතාවක් රඟනොදැක්වීම එය නරඹන්නට නොහැකි වූ අති විශාල පිරිසගේ ආවාසනාවයි.

මේ ප්‍රසංගය නරඹා ඇතිවූ උද්දාමයෙන් මම ඒ රාත්‍රියේම, මෙල්බන් හි එක්තරා පුවත්පතකට මෙයින් ලියන ලදුව ඉතා ජනප්‍රිය විශේෂාංගයක්ව තිබූ "කතා බහ" කොලමට, " යසෝදරා වත" ප්‍රසංගය පසසමින් සටහනක් ලිව්වෙමි. එහෙත් ඒ මාසයේ පුවත්පත මුද්‍රණයෙන් නිකුත් වන විට මගේ "කතා බහ" කොළම එහි නොවී ය. වරුණ සාවින්ද ගේ "යසෝදරා වත" ගැන ලියූ නිසා "කතා බහ" ඉවත් කළ බව දැනගන්නට ලැබුණි. (මේ ඉවත්කිරීම සහ එයට අදාල කතා පුවත අපූරු එකකි. බොහෝ දුර කල්පනා කර ඒ කතාව මෙහි නොලියන්නට තීරණය කළෙමි)

එදා ඒ පුවත්පතේ පළ නොකළ "කතා බහ" තීරුව පිළිබඳ අදටත් මගේ සිතේ ඇත්තේ කණගාටුවකි. මෙල්බන් වේදිකා ප්‍රසංග කලාවේ සන්ධිස්ථානයක් සනිටුහන් කළ ප්‍රසංගයක් පිළිබඳව පුවත්පතකට සටහනක් ලියන්නට නොහැකි වීම පිළිබඳ වේදනාව අදත් මට දැනෙයි.

තහනමට ලක් වූ කතා බහ කොළම

කතා බහ

ජගත් ජේ. එදිරිසිංහ

අද සුන්දර දවසක්

අද ජූනි 30. තවමත් මගේ දෙඇස් කඳුලින් බොඳ වී ඇත. එනමුදු මා මේ ලිපිය අද, මේ මොහොතේ ලියා අවසන් කළ යුතුය.

වරුණ සාවින්ද, තරුණ කලාකරුවා... නුඹ අද, මගේ අසට එක්කළ කඳුල මට කරන මේ කරදරය මම ඉවසා සිටින්නෙමි. ඒ, යමේකෙකුගේ ආසක කඳුලක් නැංවුවා නම් ඒ නිර්මාණය වළඳගේ පරිකල්පන අවර්ගයෙන්ම හෘදයාංගම නිමවුණක් බව මා දැන්නා නිසාය.

යසෝදරාවත නම් වූ අපූරු ශ්‍රී සංග්‍රහය නොබැඳූ මෙල්බන් පුරවර ශ්‍රී ලාංකිකයන් ගැන මම අවංකවම කණගාටුවෙමි.

මේ පුරවරයේ ලාංකිකයන් අතර වැඩිම ඉල්ලුම් ඇති බයිලා කාජ්ජ හැර යසෝදරාවත අභියෝගයකි. කලාව යනු හති දමාගෙන නැටීම යයි අර්ථදක්වන, එසේ පිළිගන්නා ඕනියන්ට සැබෑ කලා නිර්මාණයක් යනු මේ යයි වරුණ සාවින්ද, නුඹ පෙන්වා දුන්නෙහිය.

මෙයට වසරකට පමණ පෙර දිනෙක මෙල්බන්හි ගුවන්විදුලි මැදිරියකදී පළමුවරට වරුණ හමුවූ මොහොතේ දිම මේ තරුණයා තුල සැඟවුන යම් අපූරු හැකියාවක් ඇති බව මම වරදාගන්නෙමි. හඳුගේ සියළුම ගුවන්විදුලි නිර්මාණයන් මගා සැලසුම්කිත් සූක්ෂ්ම පරිකල්පිත නිර්මාණයන් විය. කඩිමුස්සේ එහෙන් මෙහෙන් එළිලාගත් සරවපිත්තල සැරසිලි ඔහුගේ නිර්මාණ තුළ නෙවිය. ඒ වෙනුවට තිබුණේ මගා එකමිනියකින් යුත් සැබෑ නිර්වාපිත සහ හෘදයාංගම සැරසිලිය. තමා දෙදිරිපත් කරන විශේෂාංගය පිළිබඳ නිවැරදි වැටහීමක් සහ නිවැරදි දැක්මක් ඔහු සතුවිය.

යසෝදරාවත තුළින් ප්‍රසංගයක් සංවිධානය කළ යුත්තේ කෙසේද,යි වරුණ පෙන්වාදුන්නේය. (මෙය සියල්ල දත් යයි නොසිතා වෙනෙකෙකුගෙන් ඉගෙන ගන්නට තරම් නිරහංකාර මානසිකත්වයක් ඇත්තෝ සිටින් නම් ඉගෙනගනිත්වා)

ඔහුගේ මුළු ප්‍රසංගය ප්‍රාරම්භ දස් වූයේ සැලසුම් සහගත බවයි. ඒ වරුණගේ අනන්‍යතාවයයි. ප්‍රසංගය පටන් ගත් තැන සිට අවසානය දක්වා අපි කිසි විටෙක හිස් වේදිකාව නොදුටුවෙමු. එක් අංගයක් නිමවට පැමිණෙත්ම පළුණ අංගය කිසි ලෙස සූදානම්ව තිබුනි. මුළු කාලය පුරාවටම ප්‍රේක්ෂකයන්ගේ අවධානය එක එල්ලයක රඳවා තබාගන්නට ඔහු සමත් විය.

වේදිකා සැලසුම පවා අපූරු වම්මත්කාරයක් දනවන්නට සමත් විය. කුඩා වීදුලි ආලෝක කිරණයකින් පවා වේදිකා සැලසුමට අපූර්වත්වයක් එක් කරන්නට හපුව හැකිවිය. වේදිකාව අඳුරේ තැබෙන මොහොතේ පවා වේදිකාව මත තනා තිබූ කුළුණට දකුණු පසින් ඇත සිට එළිය කර තිබූ සතා පපාතිය ආලෝක ධාරාව මැදු සුන්දරත්වය අගය කළ යුතුය. ඉතා සරල

ආලෝක කිරණයක් පවා කලාත්මකව යොදා ගන්නේ කෙසේ දැයි අපට පෙන්වා දෙන්නට වරුණ සමත් වී සිටියේය.

වෙනෙකක් තබා නිවේදිකා නිවේදිකාවන් සහ ගායක ගායිකාවන් අමතක වන දෑ කිහිපයක් කරගන්නට අගේ තබාගන්නා කොළ කැබැල්ලට පවා වරුණගේ කලාත්මක අසිහින ගැලවීයන්නට නොහැකි වී තිබුනි.

මේ සියළු විස්තර මවන්නට වරුණට ලැබී තිබුන දායකත්වය සුළුපටු නොවන බවද සැකසඳළිව පෙනෙයි. ගී ගැයූ සෙවිවන්දි, රෝහණ, දිනෙල්කා, බන්දුල සහ කළිඳු ප්‍රේක්ෂකයන් අද, බැඳ, තබාගත්හ.

"..රෝහණ යසෝදරා ගීතය කියද්ද මගේ අඟෙ හිරිවැහුණා..." ප්‍රසංගය

යසෝදරාවත අප දැක ප්‍රරුදු සම්ප්‍රදායික සංගීත සන්දර්ශනයක් නොවීය.එය මුල සිට අග දක්වා නැවුම් පරිපූර්ණත්වයකින් හෙබියාවූ අංගයම්පූර්ණ ප්‍රසංගයක් විය

කිඹේය. මම ඔහු සමග සියයට පස්සියයක් එකඟවෙමි. රෝහණ ඒ තරම් අතුරාවට ඒ ගීතය ගැයුවේය. ප්‍රසංගයේ හේමාව බෑ, යසෝදරා ගීයටත් ඔහු ගැයූ සෙසු ගීත වලටත් කිසි සාධාරණත්වය ඔහු ඉටුකළේය.

දිනෙල්කා දර්ශනී මෙල්බන් තුවරදී ගැයූ හොඳම ගී එකතුව මේ යයි ලියා තබන්නටද මම කැමැත්තෙමි.

සෙවිවන්දි, ලෝ අම්බලමේ ගැය ගයද්දී මට එම්පසින් වාඩි වී සිටි මාතාව කඳුළු විය දමනු මම දුටුවෙමි.

පැරණි ගී සංගීතවන් කිරීම පහසු නැත. කැමරාන්, එඩියන්, කළිඳු, රෝහිත, අතල යන සංගීතඥයෝ ඒ කාර්ය ඔසාවීන් ඉටුකළහ. ඔවුනට ස්තූතිවේවා.

නැටුම් යයි කියා බහුරූප කෝලම් පෙන්නන ශ්‍රී ලංකාවේ රූපවාහිනී සේවාවන් හි නැටුම් දක්වන මානවිකාවන්ට යසෝදරාවතෙහි ගාවන්හි, ඉරුංගිණි සහ විනාලිගෙන්

සැදැමි ලත් අනන්‍යතා කණ්ඩායම ඉදිරිපත් කළ නැටුම් පෙන්වන්නට තිබුනේ නම් කොපමණ අගෙද දැයි මට සිතෙයි. මගා සංයමයකින් මගා පුහුණුවකින් සහ මගා ඒකාග්‍රතයකින් යුතු අනන්‍යතා කණ්ඩායමේ නැටුම් ශ්‍රී ලංකාවේදීවත් දැකින්නට නොලැබෙන තරමේ විශිෂ්ඨත්වයකින් යුතු වූ බව නොලියා ඉන්නට මට නොහැකෙයි. ඔවුහු මෙල්බන් පුරයේ ශ්‍රී ලාංකිකයන්ට ආදරණීයයකි. මේ තරුණ තාවාගෙනාවන් තිඳෙනාට නැටුම් ඉගැන් වූ ගුරුවරියට හෝ ගුරුවරයාට හෝ මම හිස නමා ආචාර කරමි. ඒ ගුරුවරු ඒ ගෞරවයට නිසි සුදුස්සෝ වෙති.

නිවේදක කටයුතු කළ නුවන්, ජගත් යන රයිමිගේ හොඳම ඉදිරිපත් කිරීම මේ යයි මම සිතමි. බොහෝ සැලසුම් සහගතව පිටපත ඔවුනට මහතු සහයක් දුන් බවට සැකයක් නැති වුවත් ගිරවුන් මෙන් පිටපත කියන්නේ නැතිව නිසි හාවයන් පසිත වන යේ හඳුන්වාදීම් ඉදිරිපත් කරන්නට ඔවුහු සමත් වූහ.

අවසානයේ ඒ නිවේදකයින් දෙදෙනා සහ නිවේදිකාව මේවිදිකාව මත මල් තුෂක් තබා රැය මොහොත අපූරුය.

නිමල් අල්විස් සිය ඊඩියෝ නිර්මාණය තුළින් අප නැවත ශ්‍රී ලංකාවට කැඳවාගෙන ගියේය. අවමස්ථානයේ සිට ශ්‍රී පාදස්ථානය දක්වා අපි මනසින් ගමන් කළෙමු. මේ සියළු දර්ශනත් පැරණි සංගීතඥයන් ගැන ඉදිරිපත් කළ දර්ශණ සහ හැඳින් වීම් ආදියත් මේ ප්‍රසංගය වෙනුවෙන් වරුණ කොයි තරම් කාලයක් ශ්‍රමයක් වැය කළාද යන්නට හොඳම නිදසුන්ය. "..පැරණි ගීත කිව්වතුම මිනිස්සු හිනන්නන බලා ඉන්න කම්මැලි නිත්ද කියලයි... ඒ පුතත් මේක මේ තරම් ලස්සනයි කියලු මමවත් හිතුවෙ නැහැ..." මා අසල සිටි කාන්තාව ප්‍රසංගය බලන්නට නොසැඹිණි අයග ගැන සෑදහන් කමින් කිවාය. ප්‍රසංගය බැලූ සියල්ලන් ඇගේ සිතමින සතාර් කරන බව මම පැහැදිළිවම දැනිමි.

මේ සා අපූරු හැකියාවන්ගෙන් යුත් වරුණ සාවින්ද නම් වූ මේ තරුණ කලාකරුවා මෙල්බන් ගුවන් විදුලි සේවා තුළින් අගේ ප්‍රජාවට ඉටුකළ මෙහෙය අද අපට අමිමි වී ඇත්තේ කාගේ වරදින්දැයි මම සිතමින් සිටින්නෙමි. වරද කාගේ වුවත් වරුණගේ හැකියාවන් ගුවන් විදුලි තුළින් ඉවත්ව ගොස් තිබීම පොදුවේ ශ්‍රී ලාංකිකයන් සැමගේම අත්‍යාගසක් බව මට සිතෙයි.

යසෝදරාවත අද මගේ කතා බහ සම්පූර්ණයෙන්ම අයිති කරගෙන ඇත්තේය. වෙනෙකක් තබා කතා බහේ මා ලියන ලෙලිය පවා යසෝදරාවත වෙනුවෙන් වෙනස් වී ඇත. එය එසේ විය යුතුය. මා දෙඇසේ කඳුලක් නැං වූ ඒ අපූරු ප්‍රසංගය වෙනුවෙන්, ඒ සුන්දර තරුණ කලාකරුවා වෙනුවෙන්, සමාජය විසින් දැන්විය යුතු ප්‍රණාමය මෙසේ පුද කිරීම ගැන මගේ පාධකයන් අමනාප නොවන බව මම දනිමි.

මේ ලෝකය වඩා සුන්දර තැනක් බවට පත් කරන්නෝ කලා කරුවෝමය. නැති ප්‍රශ්ණ මවා පෙන්වා එවන් කලාකරුවන්ට වල කපන්නට දැඟලන ගාහලයනට යන්නට වෙනම නිරයක් තැනෙනු ඇත.